ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit

විශේෂ නිවේදනයයි

2026/2027 සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා පැවැත්වෙන නම්නීකරණ වැඩසටහන සම්බන්ධයෙනි

උක්ත උපාධි පාඨමාලාව සඳහා 2026/10/30 දිනට ලියාපදිංචි ගාස්තු හා පාඨමාලා ගාස්තු ගෙවා සම්පූර්ණ කළ සිසුන්ට අදාළ නම්නීකරණ වැඩසටහන 2026 නොවැම්බර් මස 15 වන දින පෙ.ව. 8.00 සිට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

මෙදිනට ඔබගේ ශිෂ්‍ය වාර්තා පොත නිකුත් කිරීම, සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ ව්‍යුහය සහ විෂය මාලාව හඳුන්වාදීම, අධ්‍යයන කටයුතු හා විභාග පැවැත්වෙන ආකාරය පැහැදිලි කිරීම, විද්‍යුත් ඉගෙනුම් පද්ධතිය (LMS) හා අනෙකුත් අවශ්‍ය තොරතුරු සම්බන්ධයෙන් ඔබව දැනුවත් කිරීම සහ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නිල WhatsApp සමූහයට ඔබව ඇතුලත් කර ගැනීම සිදුවන බැවින් **මේ සඳහා ඔබගේ සහභාගීත්වය අනිවාර්ය වේ.**

සියලු සිසුන් තම ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතු අතර එදිනට ඔබගේ ශිෂ්‍ය වාර්තා පොත ලබාගත යුතු කණ්ඩායම ඇතුළු වැඩිදුර තොරතුරු 2026/11/10 දිනෙන් පසු www.external.sjp.ac.lk වෙබ් අඩවිය හරහා දැනුම් දෙනු ලැබේ.

සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2026-11-04

- විමසීම් - 011 2801 481 (සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 8.30 – ප.ව. 4.15)